ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2323/41 - 2023 මාර්තු මස 17 වැනි සිකුරාදා - 2023.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී. 6/2022

**2007 අංක 07 දරන සමාගම් පනත**

2007 අංක 7 දරන සමාගම් පනතේ 222 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 527 වන වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කර්මාන්ත අමාත්‍ය.**

2023 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2023 අංක 1 දරන සමාගම් (ලේකම්වරයන් පිළිබඳ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල සඳහන් විධිවිධාන රුපියල් ලක්ෂ පහක හෝ ඊට වැඩි ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත හෝ රුපියල් මිලියනයක හෝ ඊට වැඩි වාර්ෂික පිරිවැටුමක් සහිත යම් සමාගමක ලේකම්වරයෙකුට අදාළ විය යුතු ය.

3. (1) තැනැත්තකු -

(අ) වයස අවුරුදු දහඅටට වැඩි නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම්;

(ඇ) (මේ නියෝගවල "වෘත්තියෙහි යෙදීමේ සහතිකය" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ නියෝග යටතේ නිකුත් කරන ලද යම් සමාගමක ලේකම්වරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් දරන්නකු නම්; සහ

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වන්නේ නම්; හෝ

1A - G 39123 — 07 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඉ) (i) 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ සාමාජිකයකු වේ නම්;

(ii) 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා වරලත් සංස්ථා ලේකම්වරයන්ගේ ආයතනයේ සාමාජිකයකු වේ නම්;

(iii) එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීවරයන්ගේ වරලත් ආයතනයේ සාමාජිකයකු වේ නම්;

(iv) 2009 අංක 23 දරන සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරයන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු වේ නම්; හෝ

(v) එක්සත් රාජධානියේ සහ අයර්ලන්තයේ වරලත් පාලන ආයතනයේ සාමාජිකයකු වේ නම්;

හැර, එකී තැනැත්තා සාමාගම් ලේකම්වරයකු ලෙස ක්‍රියාකිරීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සංස්ථාපිත මණ්ඩලයක -

(අ) එම සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් එම සමාගම, සමාගම් ලේකම් වෘත්තියෙහි යෙදී සිටින බවට නිශ්චිතව සඳහන් කර ඇත්නම්;

(ආ) එම සමාගමේ කොටස්වලින් බහුතරය ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් දරනු ලබයි නම්; සහ

(ඇ) එම සමාගමේ එක් අධ්‍යක්ෂවරයකු විසින් වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් දරන්නේ නම්,

හැර, එවැනි සංස්ථාපිත මණ්ඩලයක්, ලේකම්වරයකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය.

(3) ව්‍යාපාර ආයතනයක -

(අ) තනි අයිතිකරුවකු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී,

(i) තනි අයිතිකරුගේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය මගින් එය සමාගම් ලේකම් වෘත්තියෙහි යෙදී සිටින බවට නිශ්චිතව සඳහන් කරනු ලබයි නම්; සහ

(ii) තනි අයිතිකරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම් සහ වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් දරන්නේ නම්; හෝ

(ආ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී,

(i) එම හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය මගින් එය සමාගම් ලේකම් වෘත්තියෙහි යෙදී සිටින බවට නිශ්චිතව සඳහන් කරනු ලබයි නම්; සහ

(ii) හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකුම වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් දරන්නේ නම්,

හැර, සමාගම් ලේකම්වරයකු වශයෙන් ක්‍රියා කිරීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය.

4. (1) තැනැත්තකු -

(අ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් සිහිවිකල තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබ ඇත්නම්;

(ආ) බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබ, වැළැක්විය නොහැකි වූ අලාභ හෝ අභාග්‍ය හේතුකොට ගෙන සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ඔහුගේ බුන්වත්භාවය හෝ බංකොලොත්භාවය උද්ගතවී ඇති බවට නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් සහතිකයක් ප්‍රදානය කර නොමැති නම්;

(ඇ) චරිත දූෂණයට අදාළ යම් අපරාධ සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක දී නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ ඇත්නම්;

(ඈ) 3 වන නියෝගයේ (1) වන අනු-නියෝගයේ නියමකර ඇති සුදුසුකම් දරීම අවසන් කර ඇත්නම්;

(ඉ) රෙජිස්ට්‍රාර්වරයා විසින්, රෙජිස්ටරයෙන් ඉවත්කරනු ලැබ ඇත්නම්,

එවැනි තැනැත්තකු සමාගම් ලේකම්වරයකු වශයෙන් ක්‍රියා කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(2) තැනැත්තකු, සංස්ථාපිත මණ්ඩලයක් හෝ ව්‍යාපාර ආයතනයක් විගණකවරයකු ලෙස ක්‍රියාකරයි නම්, එවැනි තැනැත්තකු, එවැනි සංස්ථාපිත මණ්ඩලයක්, එවැනි සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු සහ සේවා නියුක්තිකයකු හෝ එවැනි ව්‍යාපාර ආයතනයක සාමාජිකයකු සමාගම් ලේකම්වරයකු ලෙස ක්‍රියා කරනු නොලැබිය යුතු ය.

5. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වෘත්තියෙහි යෙදීමේ සහතිකයක අධිකාරිය යටතේ මිස, තැනැත්තකු, සමාගම් ලේකම්වරයකු වශයෙන් ක්‍රියා කරනු නොලැබිය යුතු ය.

(2) වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන තැනැත්තකු විසින්, සමාගම් ලේකම් කාර්ය ක්ෂේත්‍රයෙහි අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයක් සැපයීම සඳහා නිර්මාණය කරන ලද වැඩසටහනක් හදාරා ඇති බවට වූ සහතිකයක් ඇතුළත් සහතික සමග මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවක් සමගින් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙහි දක්වා ඇති ආකෘතිය මගින් මාර්ගගත ක්‍රමයට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) සමාගම් ලේකම් කාර්ය ක්ෂේත්‍රයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයක් සැපයීම සඳහා නිර්මාණය කරන ලද සෑම වැඩසටහනක්ම පැය දහයකට නොඅඩු විය යුතු ය. රෙජිස්ට්‍රාර්වරයා විසින්, අවශ්‍ය අවස්ථාවලදී වැඩිදුර තොරතුරු සපයන ලෙස ඉල්ලුම්කරු වෙත නියම කරනු ලැබිය හැකි ය.

6. 5 වන නියෝගයේ සඳහන් ඉල්ලීම සහ සහතිකය ලැබීමෙන් පසුව, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම් පත්‍රයේ සහ සහතික පත්‍රවල අන්තර්ගත කරුණු පිළිබඳ සලකා බැලීමෙන් පසුව, වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් නිකුත් කිරීම හෝ ඔහු විසින් වාර්තාකරනු ලැබීමට නියමිත හේතු දැක්වීමෙන් පසුව වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය යුතු ය. රෙජිස්ට්‍රාර්වරයා විසින් නිල වෙබ් අඩවිය හරහා ඉල්ලුම්කරු වෙත සිය තීරණය පිළිබඳ දැනුම් දිය යුතු අතර වෘත්තියෙහි යෙදීමේ සහතික පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, ඔහු විසින් ඒ සම්බන්ධයෙන් තම හේතු ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

7. යම් ලිත් වර්ෂයක කාලසීමාවක් තුළ දී නිකුත් කරන ලද සෑම වෘත්තියෙහි යෙදීමේ සහතිකයක්ම කලින් අවලංගු කරන්නේ නම් මිස, පසුව එළඹෙන වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනය දක්වා වලංගු වන අතර එහි නිශ්චිතව දක්වා ඇති නියම හා කොන්දේසිවලට යටත් වන්නේ ය.

8. වෘත්තියෙහි යෙදීමෙ සහතිකය දරන්නා විසින් සමාගම් පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන හෝ එකී සහතිකයේ නියම හා කොන්දේසි උල්ලංඝනය කර ඇති බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, මේ නියෝග යටතේ නිකුත් කරන ලද වෘත්තියෙහි යෙදීමේ සහතික පත්‍රයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකි ය.

9. (1) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සමග පසුව එළඹෙන වර්ෂය වෙනුවෙන් එක් එක් ලිත් වර්ෂයේ නොවැම්බර් මස 1 වන දින හෝ එදිනට පෙරාතුව රෙජිස්ට්‍රාර්වරයා වෙත තත්කාර්ය සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මගින්, මේ නියෝග යටතේ නිකුත් කරන ලද වෘත්තියෙහි යෙදීමේ සහතිකය අලුත් කරනු ලැබිය යුතු ය.

(2) වෘත්තියෙහි යෙදීමේ සහතිකය දරන්නා විසින් වෘත්තියෙහි යෙදීමේ සහතිකයේ නියම හා කොන්දේසි අනුගමනය කරනු ලැබ ඇති බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වේ නම් පමණක් රෙජිස්ට්‍රාර්වරයා විසින් වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් අලුත් කරනු ලැබිය යුතු ය.

10. (1) වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇත්තේ කවර තැන්ත්තන් වෙත ද එවැනි සියලු තැනැත්තන්ගේ විස්තර ඇතුළත් රෙජිස්ටරයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය. එම රෙජිස්ටරයේ වෙනත් කරුණු අතර පහත දැක්වෙන කරුණු අන්තර්ගත විය යුතු යː-

(අ) එය පුද්ගලයකු හෝ තනි අයිතිකරුවකු වන අවස්ථාවක දී, එම පුද්ගලයාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, රාජකාරී ලිපිනය, පදිංචි ලිපිනය, විද්‍යුත් තැපැල් ලිපිනය සහ ඇමතුම් විස්තර;

(ආ) එය සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක දී, එම සමාගමේ ලියාපදිංචි අංකය, සමාගම් ලිපිනය, අධ්‍යක්ෂවරුන්ගේ සහ කොටස් හිමියන්ගේ නම්, ජාතික හැඳුනුම්පත් අංක, රාජකාරී ලිපිනයන්, පදිංචි ලිපිනයන්, විද්‍යුත් තැපැල් ලිපිනයන් සහ ඇමතුම් විස්තර; හෝ

(ඇ) එය හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක දී, ලියාපදිංචි අංකය, සාමාජිකයන්ගේ සහ හවුල්කරුවන්ගේ නම්, එක් එක් පුද්ගලයන්ගේ ලිපිනයන්, විද්‍යුත් තැපැල් ලිපිනයන් සහ ඇමතුම් විස්තර;

(2) ලේකම්වරයකුගේ විස්තරවල යම් වෙනස්වීමක් සිදුවුවහොත් එම වෙනස්වීම සිදු වී වැඩකරන දින විස්සක් ඇතුළත මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද සමගින් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ දක්වා ඇති පරිදි එම වෙනස්වීම රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

11. සමාගම් ලේකම් කාර්ය ක්ෂේත්‍රයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයක් සැපයීමට නිර්මාණය කරන ලද වැඩසටහන -

(අ) 3 වන නියෝගයේ (1) වන අනු-නියෝගයේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති මණ්ඩලයක් හෝ සංවිධානයක් මගින්;

(ආ) ශ්‍රී ලංකා නීතිඥ සංගමය මගින්; හෝ

(ඇ) රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ ලැයිස්තුගත කර ඇති වෙනත් යම් මණ්ඩලයක් හෝ සංවිධානයක් මගින්;

පවත්වනු ලැබිය හැකි ය.

12. රෙජිස්ට්‍රාර්වරයා විසින්,

(අ) ඒ තැනැත්තා එකී ඉවත් කිරීම සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇත්නම්;

(ආ) 8 වන නියෝගය යටතේ වෘත්තියෙහි යෙදීමේ සහතිකය ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇත්නම්;

(ඇ) ඒ තැනැත්තා මියගොස් ඇත්නම්;

(ඈ) මේ නියෝගවල 4 වන නියෝගය යටතේ ඒ තැනැත්තා නුසුදුස්සකු වී ඇත්නම්;

(ඉ) 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ඒ තැනැත්තා අධ්‍යක්ෂවරයකු වශයෙන් ක්‍රියාකිරීම සඳහා නුසුදුස්සකු බවට පත්ව ඇත්නම්;

එවැනි යම් තැනැත්තකුගේ නම රෙජිස්ටරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් තැනැත්තකුගේ නම රෙජිස්ටරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් එම අදාළ තැනැත්තා වෙත ඒ පිළිබඳව වෙබ් අඩවිය හරහා නොපමාව දැනුම් දෙනු ලැබිය යුතු අතර එම ඉවත් කිරීම පිළිබඳව *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය.

(3) (1) වන අනු නියෝගය යටතේ රෙජිස්ටරයෙන් නම ඉවත්කර ඇති යම් තැනැත්තකුගේ නම, යහපත් හේතු දැක්වීමක් අනුව නැවත ස්ථාපිත කරනු ලැබිය හැකි ය.

(4) රෙජිස්ට්‍රාර්වරයා විසින් මේ නියෝග යටතේ කරන ලද යම් තීරණයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු හට 2007 අංක 07 දරන සමාගම් පනතේ 472 වන වගන්තිය ප්‍රකාරව එම තීරණයට එරෙහි අභියාචනය කිරීමේ අයිතියක් ඇත්තේ ය.

13. රෙජිස්ට්‍රාර්වරයා විසින් මේ නියෝග යටතේ නිකුත් කරන ලද වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් දරනු ලබන ලේකම්වරුන්ගේ නම් ඇතුළත් ලැයිස්තුවක් සෑම වර්ෂයකම මාර්තු මස 31 වැනි දිනට පෙර දිනයක දී *ගැසට් පත්‍රයේ* පළ කිරීමට කටයුතු කළ යුතු අතර එම ලැයිස්තුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ ද පළකරනු ලැබිය යුතු ය.

14. සමාගම් ලේකම්වරයකු විසින් ඉටුකරනු ලැබිය යුතු බවට නීතිය මගින් නියම කර ඇති යම් ක්‍රියාවක්, මේ නියෝග යටතේ නිකුත් කරන ලද වලංගු වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් නොදරනු ලබන තැනැත්තකු විසින් ඉටුකරනු ලබයි නම්, එම ක්‍රියාව අවලංගු වන්නේ ය.

15. (1) 1987 සැප්තැම්බර් මස 14 දින අංක 471/6 දරන අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද 1987 සමාගම් (ලේකම්වරයන් පිළිබඳ) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

එසේ වුවද, 1987 සමාගම් (ලේකම්වරයන් පිළිබඳ) නියෝගවල සඳහන් විධිවිධාන යටතේ නිකුත් කරන ලද වෘත්තියෙහි යෙදීමේ සහතික මේ නියෝග ක්‍රියාත්මකවීමේ දින සිට තවදුරටත් වූ මාස හයක කාලසීමාවක් සඳහා අඛණ්ඩව වලංගු වන්නේ ය.

(2) මේ නියෝග බලාත්මක වන දිනයේ දී සමාගම් ලේකම්වරයකු වශයෙන් ක්‍රියාකරනු ලබන තැනැත්තකු හට, මේ නියෝගවල 2 වන සහ 3 වන නියෝගවල අන්තර්ගත විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ නියෝග බලාත්මකවීමේ දින සිට මාස හයක කාලසීමාවක් සඳහා සමාගම් ලේකම්වරයකු ලෙස අඛණ්ඩව ක්‍රියා කිරීම් සඳහා අවසර ලබාදිය යුතු ය.

(3) (1) වන අනු-නියෝගයේ සඳහන් මාස හයක කාලසීමාව අවසන්වීමට පෙරාතුව, එම නියෝගයේ සඳහන් සමාගම් ලේකම්වරයකු විසින් මේ නියෝග යටතේ වූ ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

එසේ වුවද, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව මේ අනු නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සඳහා අදාළ නොවිය යුතු ය.

(4) මාස හයක කාලසීමාව ඇතුළත ලියාපදිංචි වීමට අපොහොසත් වන යම් තැනැත්තකු ලේකම්වරයකු ලෙස ලියාපදිංචි නොවී ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර එවැනි ලේකම්වරයකුගේ නම රෙජිස්ටරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

16. මේ නියෝගවල -

"රෙජිස්ටරය" යන්නෙන්, මේ නියෝග යටතේ තැබීමට නියමිත රෙජිස්ටරයක් අදහස් වේ; සහ

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නට, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

**උපලේඛනය**

**ගාස්තු**

**[5(2), 9(1) සහ 10 (2) නියෝග]**

| අංකය | විස්තර | මුදල (රු.) |
|---|---|---|
| 1. | වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් සඳහා (ආපසු නොගෙවන) | 10,000/- |
| 2. | වෘත්තියෙහි යෙදීමේ සහතිකයක් අලුත් කිරීම සඳහා ඉල්ලීම<br>- පුද්ගලයකු<br>- වෙනත් | <br>2,500/-<br>5,000/- |
| 3. | ලේකම් සම්බන්ධ විස්තර වෙනස් කිරීම - පුද්ගලයකු<br>- වෙනත් | 2,500/-<br>5,000/- |

EOG 03 - 205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.